ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ

වාර්ෂික වාර්තාව 2022



ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

114/9, විජේරාම මාවත

කොළඹ 07,

ශ්‍රී ලංකාව

අන්තර්ගතය

දැක්ම 3

මෙහෙවර 3

ඉලක්ක 4

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුණු 4

සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2022 5

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය 9

සභාපතිවරයා ගේ වාර්තාව 10

ලේකම්වරයා ගේ වාර්තාව 12

2022 වසර තුළ ශ්‍රීලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම් 14

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය 32

විද්‍යාඥවරුන් අභිප්‍රේරණය කිරීම 35

අරමුදල් සැපයීම 39

මානව සම්පත් සංවර්ධනය 40

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම -2022 42

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කාර්ය මණ්ඩලය 43

කෘතඥතාව 45

අවසන් ගිණුම් 46

ගිණුම් සාරාංශය 73

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා 74

විගණන වාර්තාව 77

විගණන වාර්තාවට පිළිතුරු 87

වාර්ෂික වාර්තාව - සාරාංශය 90

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය සහතික කෙරෙන සුපැහැදිළි හා තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන පද්ධතියක්

මෙහෙවර

ප්‍රතිපත්ති සැකසීම, සුසාධ්‍යකරණය, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා අගැයීම සහ බලපෑම් තක්සෙරුව හරහා ජාතික සංවර්ධන ඉලක්ක වෙත කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදන යොමු කිරීම පිළිබඳ ව සහතික වීම

ඉලක්ක

1 වන ඉලක්කය: කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදනය ජාතික සංවර්ධන ඉලක්ක වෙත දිශානති කිරීම

2 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ ධාරිතා බල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

3 වන ඉලක්කය: ලෝක සම්මානනීය පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන තත්ත්වය සාක්ෂාත් කරගැනීම

4 වන ඉලක්කය: රේඛීය නියෝජිතායතන තුළ අඛණ්ඩ කාර්යසාධන අගැයීම ප්‍රවර්ධනය කිරීම

5 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ව්‍යාප්තිකරණය හා දැනුවත්භාවය බිහි කිරීම ප්‍රවර්ධනය කිරීම

6 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට සේවා සැපයීම් වස් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනයික ධාරිතා බලය ශක්ති සම්පන්න කිරීම

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුණු

1. කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදනයන්හි විශිෂ්ටත්වය ළඟා කරගැනීම
2. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගැනීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ හා නවෝත්පාදන දිශානති කිරීම
3. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ හා නවෝත්පාදන පද්ධතියේ (විද්‍යාත්මක හා තාක්ෂණික) ධාරිතාව වැඩිදියුණු කිරීම.
4. කෘෂිකාර්මික සංවර්ධනයට ආධාර කිරීම අරභයා ඉහළ ප්‍රමිතියෙන් යුතු, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
5. ලෝක මට්ටමේ පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන සාක්ෂාත් කරගැනීම සඳහා කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම
6. ජාතික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් වල සහ ආයතනවල ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම
7. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් ව්‍යාප්ත කිරීම හා දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම
8. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම

සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2022

1. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සභාපති මහාචාර්ය ගාමිණි සේනානායක මැතිතුමා
2. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) ආචාර්ය ගාමිණි සමරසිංහ මැතිතුමා
3. මුදල් අමාත්‍යාංශයේ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්. ජී. වී. කේ. ටී. ගුණවර්ධන මැතිනිය
4. මුදල් අමාත්‍යාංශයේ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ බී. ඒ. එන්.හර්ෂණි මැතිනිය
5. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා
6. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, අතිරේක සංරක්ෂණ ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන), දීපානි අලවතුගොඩ මැතිනිය
7. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි මැතිතුමා
8. ගන්නෝරුව, පශු පර්යේෂණ ආයතනයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පශු පර්යේෂණ), පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන මහත්මිය
9. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආර්ථික විද්‍යාඥ චිත්‍රාල් ජයවර්ධන මැතිතුමා
10. තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එල්. එස්. කේ. හෙට්ටිආරච්චි මැතිතුමා
11. වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජේ. එම්. ටී. ජයසුන්දර මහත්මිය
12. ජාතික විද්‍යා පදනමෙහි සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා
13. ඇග්‍රෝ කල්චර් ට්‍රෙන්ඩ්ස් පෞද්ගලික සමාගමෙහි සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ අනුර වීරකෝන් මැතිතුමා
14. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ලේකම්/ අධ්‍යක්ෂ ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා

සභා පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා සාමාජිකවරුන් පැමිණීම

අංක	නම	246 වන රැස්වීම 18.01.2022	247 වන රැස්වීම 15.02.2022	248 වන රැස්වීම 15.03.2022	249 වන රැස්වීම 16.08.2022	250 වන රැස්වීම 26.09.2022	251 වන රැස්වීම 18.10.2022	252 වන රැස්වීම 20.12.2022
1	මහාචාර්ය ගාමිණි සේනානායක	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
2	ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
3	ඩබ්ලිව්. එල්. ජී. සමරසිංහ	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
4	පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියේ නැත
5	ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	x
6	බී. ඒ. එන්. හර්ෂණී මැතිනිය	x	x	x	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය
7	ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේ නැත	x
8	චිත්‍රාල් ජයවර්ධන මහතා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
9	ආචාර්ය එල්.එස්.කේ.හෙට්ටිආරච්චි	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය
10	ජේ. එම්. ටී.ජයසුන්දර මහත්මිය	පැමිණියාය	පැමිණියාය	පැමිණියේ නැත	x	x	x	x
11	මහාචාර්ය රංජිත් සේනාරත්න	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය
12	අනුර වීරකෝන් මැතිතුමා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත
13	එච්. ජී. වී. කේ. ටී. ගුණවර්ධන මැතිනිය	පැමිණියාය	පැමිණියාය	පැමිණියේ නැත	x	x	x	x
14	දීපානි අලවතුගොඩ මැතිනිය	පැමිණියාය	පැමිණියේ නැත	පැමිණියාය	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියාය	පැමිණියාය

පත් නොකෙරිණ. x

සභා පාලක මණ්ඩලයේ රැස්වීම් - 2022

2022 වර්ෂය තුළ පාලක සභා රැස්වීම් සතක් පවත්වන ලදී. 2022 වසරෙහි දී සභා පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස මහාචාර්ය ගාමිණි සේනානායක මැතිතුමා කටයුතු කළේ ය.2022 වසරෙහි දී පාලක මණ්ඩලයේ ලේකම්/ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා ය.

විගණන හා කළමනාකරණ කමිටුව -2022

2022 වර්ෂය තුළ ප්‍රතිපත්ති සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව (AMC) විසින් මූල්‍ය හා පරිපාලනමය කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් දෙකක් පවත්වන ලදී.

නම	ආයතනය	65 වන රැස්වීම 20.09.2022	66 වන රැස්වීම 30.12.2022
බී. ඒ. එන්. හර්ෂණී මැතිනිය (සභාපති)	නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය	පැමිණියාය	පැමිණියාය
චිත්‍රාල් ජයවර්ධන මහතා	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආර්ථික විද්‍යාඥ	X	පැමිණියේය
ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා	අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	පැමිණියේය	X
ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි	අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය	පැමිණියේය	X
ඩබ්ලිව්. එස්. බෝපගමගේ මහත්මිය	විගණන අධිකාරී, කෘෂිකර්ම, ගොවිජන රක්ෂණ මණ්ඩලය	පැමිණියාය	පැමිණියාය
ඩබ්ලිව්. එල්. ජී. සමරසිංහ	අතිරේකලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය	X	පැමිණියේය
ඊ. ඩබ්ලිව්. පී. කේ. ප්‍රියදර්ශන මහතා	අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම අමාත්‍යාංශය	පැමිණියේය	X

X - සභා පාලක මණ්ඩලයට පත් නො කෙරිණ.

හැඳින්වීම

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත බලාත්මක කිරීමත් සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1987 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) පිහිටුවන ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS) තුළ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ක්‍රියාකාරී සහයෝගිත්වය ලබා දීම සභාව මඟින් ඉටු විය. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මඟින් කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය වේ. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම තුළින් අන්තර්-ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, පර්යේෂණයන්හි ඇති බාධක නිරාකරණය කිරීම සහ අදාළ කමිටුවල ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා කාර්යභාරයක් ඉටුකිරීමයි. සභා පාලක මණ්ඩලය විසින් පිහිටුවන ලද පහත දැක්වෙන ජාතික ආංශයික කමිටු හයක් වර්තමානයේ දී ක්‍රියාත්මක වෙයි:

ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFCS)

වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව(NCPCS)

මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFLS)

වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFS)

ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFARS)

පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව(NCLPS)

මෙයට අමතරව, විශේෂිත විද්‍යාත්මක සේවාවන් සඳහා විශේෂ විද්‍යාත්මක කමිටු පත්කරන ලදී;

i. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව පිළිබඳ සංස්කාරක මණ්ඩලය
ii. පර්යේෂණ දීමනාව පිළිබඳ අනුකමිටු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය

1. කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳව රජයට උපදෙස් දීම;
2. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම;
3. ජාතික සංවර්ධන අරමුණු තවදුරටත් ඉදිරියට ගෙනයාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණ වල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම;
4. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන හා සංස්ථාපන වලට අවශ්‍ය මූල්‍ය, මිනිස් බල හා භෞතික සම්පත් සහ එම ආයතනවල සහ සංස්ථාපනවල කාර්ය මණ්ඩලයේ සේවා තත්ත්වයන් පිළිබඳ සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම;
5. ආයතනික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ ඒවායේ ප්‍රමුඛතා සහ අරමුදල් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන විෂයයභාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම;
6. කෘෂිකාර්මික පර්යේෂණ වල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැපයීම;
7. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියාකිරීම;
8. අන්තර්-ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම;
9. සමස්ත කෘෂිකාර්මික පර්යේෂණ අංශය සඳහා විශේෂ විද්‍යාත්මක සේවාවන් සංවිධානය කිරීම හා අරමුදල් සැපයීම;
10. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාවය ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීම;
11. කෘෂිකාර්මික පර්යේෂණ වලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;
12. කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සලස්වා දීම හා විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥවරුන් හුවමාරු කරගැනීම; සහ
13. කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන හා අංශ වල කාර්ය සාධනය කලින් කල සමාලෝචනය කිරීම.

සභාපතිවරයා ගේ වාර්තාව

කෘෂිකාර්මික පර්යේෂණ, කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීම සඳහා දායක වෙමින් රටෙහි ආර්ථිකය සංවර්ධනය කර ආහාර සුරක්ෂිතතාවය තිර කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි .එබැවින් ,ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ අනුග්‍රහය යටතෙහි ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ (NARS)විද්‍යාඥවරුන් හයසියයකට අධික පිරිසක් පර්යේෂණ වැඩසටහන් සිදු කරති .රට තුළ පවතින වත්මන් මූල්‍ය අර්බුදය සමඟ, 2022 වසරෙහි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම දැඩි තීරණාත්මක තත්ත්වයකට මුහුණ දුන් නමුදු මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කෘෂිකර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ අග්‍රස්ථ සංවිධානය ලෙස පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම, ප්‍රගතිය අධීක්ෂණය කිරීම ,සමාලෝචනය කිරීම, කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයන්හි මානව සම්පත් ධාරිතාව ගොඩනැංවීම වැනි විවිධ වැඩසටහන් හරහා රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දීමට කටයුතු කර ඇත .

මෙම වර්ෂයේදී ,ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) යටතෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි පර්යේෂණ ව්‍යාපෘති තිස් පහක් ,(35) ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ (NARP-NUS)පර්යේෂණ ව්‍යාපෘති දහයක් (10) සහ අන්තර් ආයතනික සහ බහුවිධ පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය (IIMDRGS)යටතෙහි පර්යේෂණ ව්‍යාපෘති පහක් (05)ලෙස ව්‍යාපෘති පනහක්(50)ක් සඳහා අරමුදල් සපයා ක්‍රියාත්මක කරන ලදී .මෙම ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා ලබා ගන්නා ලද අතර අදාළ කමිටු/අනුකමිටු විසින් ඇගයීමට ලක් කෙරිණ . පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය ,(FRDI)උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI), ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය ,(PGRC)ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය ,(NRMC)ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ,(GLORDC)ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (FCRDI),වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRDI) හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයය (UoP) හි සිදු කරන ලද ව්‍යාපෘති 31ක් සම්බන්ධ ව වාර්ෂික ස්ථානීය ප්‍රගති නිරීක්ෂණ සිදු කරනු ලැබිණ. එයට අමතරව ,ව්‍යාපෘති සමාප්ති වාර්තා 20ක් ලබා ගනිමින් ඇගයීම සඳහා බාහිර සමාලෝචකවරුන් වෙත යවන ලදී.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතනයන්හි ප්‍රධානීන් සහ අදාළ අමාත්‍යාංශ නිලධරයන් අතර වාර්ෂික සංවාදය 2022 නොවැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි දී පැවැත්විණ. සභා පාලක මණ්ඩලයෙහි සාමාජිකවරුන් ද මෙම සංවාදයට සහභාගී වූ අතර රටෙහි කෘෂිකාර්මික පර්යේෂණ හා සම්බන්ධ දැවෙන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරනු ලැබිණ.මානව සම්පත් සහ විද්‍යාත්මක උපකරණ හිඟය සහ ප්‍රමාණවත් නොවන අරමුදල් සැපයුම මතු කර දක්වමින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ නිලධරයන් **අවධාරණය** කර සිටියේ සිය ආයතනවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි දී මෙම බරපතළ ප්‍රශ්න පැන නඟින බව ය. ගැටළු මහඟරවා ගැනීමට අදාළ කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරිණ.

ප්‍රතිපත්ති සභාවෙහි ධාරිතා බල ගොඩනැංවීමේ වැඩසටහන යටතේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ නිලධරයන් හට ශිෂ්‍යත්ව 79ක් ලබා දී ඇති අතර ඔවුහු ඉන්දියාව ,පිලිපීනය ,මැලේසියාව සහ තායිලන්තය වැනි ආසියානු රටවල්වල විවිධ විශ්ව විද්‍යාලවල ආචාර්ය උපාධි හෝ විද්‍යාපති උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී සිටිති. ප්‍රතිපත්ති සභාව දායක ආයතනය ලෙස පද්ධතියෙහි නිලධරයන් හට අරමුදල් ඇතුළු අවශ්‍ය ආධාර ලබා දී තිබේ . ශිෂ්‍යත්වලාභීන්ගෙන් 26දෙනෙක් සිය පශ්චාත් උපාධි කටයුතු සාර්ථකව අවසන් කර සිටිති. 52දෙනෙක් සිය අධ්‍යයන කටයුතු කරමින් සිටින අතර උපාධි කටයුතු අතහැර දැමුයේ එක් ශිෂ්‍යත්වලාභියෙක් පමණි.මෙයට අමතරව ,ප්‍රතිපත්ති සභාව, 2022 වසරෙහි සිට දේශීය පශ්චාත් උපාධි වැඩසටහන ආරම්භ කර, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේආයතනයේ (HARTI)විද්‍යාඥවරුන් දෙදෙනකු හට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු දේශීයව සිදු කිරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කළේ ය.

මෙම තීරණාත්මක කාල සීමාව තුළ ආයතනය නිසි ලෙස කළමනාකරණය කිරීම පිණිස ලබා දුන් සහයෝගය වෙනුවෙන් මම සියලු ම සභාපාලක මණ්ඩල සාමාජිකවරුන්හට මා ගේ කෘතඥතාව පළකරමි. සිය සේවාවන් ඉටු කිරීමෙහි ලා ආයතන අධ්‍යක්ෂ, පර්යේෂණ කළමනාකරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සභා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥවරුන්, පර්යේෂණ නිලධරයන්, පරිපාලන සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරි සහ සියලු ම කාර්යමණ්ඩල සාමාජිකවරුන් ගේ කැපවීම හා කාර්ය සාධනය අගය කරමින් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මහාචාර්ය ගාමිණි සේනානායක
සභාපති
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

ලේකම්වරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව 2022 වර්ෂයේ දී ද 1987 අංක 47 දරණ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතට අනුව සිය කාර්යයන් ඉටු කළ අතර රටෙහි මූල්‍ය අර්බුදකාරී තත්ත්වයන් සමඟ වුවද සාර්ථක ව කටයුතු සිදු කළේ ය. සභාවෙහි ධාරිතා සංවර්ධන වැඩසටහන හරහා මානව සම්පත් සංවර්ධනය කිරීම, පර්යේෂණ අරමුදල් ලබා දීම, විද්‍යාඥවරුන් සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් මඟින් ප්‍රතිපත්ති සභාව ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය වෙත සක්‍රීයව සහාය ලබා දී තිබේ.

පළමු වැනි සහ දෙවැනි අර්ධ සඳහා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි ආයතනවල සහ විශ්ව විද්‍යාලයන්හි ව්‍යාපෘති වෙතින් ලබා ගන්නා ලදු ව, අර්ධ වාර්ෂික ප්‍රගති අධීක්ෂණය අදාළ කමිටු/ අනුකමිටු විසින් සිදු කරන ලදී. පර්යේෂණ ව්‍යාපෘති 50 ක ප්‍රගතිය අගැයීමට බඳුන් කෙරිණ. පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය, ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, රනිල හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ක්ෂෙත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ පේරාදෙනිය විශ්ව විද්‍යාලයය විසින් සිදු කළ පර්යේෂණ ව්‍යාපෘති 31 ක වාර්ෂික ස්ථානීය ප්‍රගති අධීක්ෂණය කිරීම නිම කෙරිණ.

සභා පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් කමිටුවක් මඟින් ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ බාහිර සමාලෝචනය 2022 වසරෙහි දී සිදු කරන ලදු ව, එම වාර්තාව මෙම වසරෙහි දී ම සභා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිණ.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 13 ක් සහ උප ආයතන 19 ක් ඇතුළු ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)වෙතින් ප්‍රතිපත්ති සභාව වාර්ෂික ව, විද්‍යුත් ආකෘතියක් තුළ, පර්යේෂණ නිලධරයන්, පර්යේෂණ ව්‍යාපෘති සහ පුනරාවර්තන පර්යේෂණ අයවැය පිළිබඳ ගෙවුණු වර්ෂයට සම්බන්ධ තොරතුරු එක්රැස් කරයි. 2022 වසරෙහි දී දත්ත පදනම් තිස් එකක් එකතු කිරීමට අපේක්ෂා කළ අතර විසි හයක් එකතු කරන ලදී. එක්රැස් කරන ලද දත්ත පදනම් සකස් කර, පිරිපහදු කර යළි අදාළ ආයතනයවලට ඉදිරිපත් කෙරිණ. සකස් කරන ලද මෙම දත්ත පදනම් ඉන්ෆෝර්ම් - 2021 ජාතික දත්ත පදනම ලෙස සම්පාදනය කෙරිණ. නව ඉන්ෆෝර්ම් සම්බන්ධිකාරකවරුන් පස් දෙනකු සඳහා අන්තර්ජාලය හරහා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිපත්ති සභාවෙහි ධාරිතාබල ගොඩනැංවීමේ වැඩසටහන යටතේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ නිලධරයන්හට ශිෂ්‍යත්ව 79ක් ලබා දී ඇති අතර ශිෂ්‍යත්වලාභීන්ගෙන් 26දෙනෙක් සිය පශ්චාත් උපාධි කටයුතු සාර්ථකව අවසන් කළහ. 52දෙනෙක් සිය අධ්‍යයන කටයුතු කරමින් සිටිති.මෙයට අමතරව ,ප්‍රතිපත්ති

සභාව, 2022 වසරෙහි සිට දේශීය පශ්චාත් උපාධි වැඩසටහන ආරම්භ කර, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ (HARTI)විද්‍යාඥවරුන් දෙදෙනකු හට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු දේශීයව සිදු කිරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කළේ ය.

2022 වසරෙහි දී, ප්‍රතිපත්ති සභාව, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ විද්‍යාඥවරුන් වෙනුවෙන් වැඩමුළු තුනක්, එනම්, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතනයන්හි ප්‍රධානීන් සහ අදාළ අමාත්‍යාංශ නිලධරයන් අතර වාර්ෂික සංවාදය 2022 නොවැම්බර් මස 29 වැනි දින ද අතථ්‍ය සම්මේලනයක් ලෙස මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මේලනය (NASFLOR-2022)2022 දෙසැම්බර් මස 22 වන දින ද, ප්‍රතිපත්ති සභාවෙහි ධාරිතාබල ගොඩනැංවීමේ වැඩසටහන යටතෙහි ආචාර්ය උපාධි නිබන්ධනය සභාවට භාර දීමෙහි කාර්යය 2022 සැප්තැම්බර් මස 06 වන දින ද යනුවෙනි.

අවසාන වශයෙන්, ප්‍රතිපත්ති සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සභාවේ සභාපති, සභා පාලක මණ්ඩල සාමාජිකවරුන්, විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකවරුන්, සියලු ම ජාතික කමිටු සාමාජිකවරුන් සහ ප්‍රතිපත්ති සභාවෙහි කාර්ය මණ්ඩලය 2022 වසරෙහි දී ලබාදුන් සහයෝගය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළකරමි.

ප්‍රභාත් විමල් කුමාර

ලේකම්/ අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

2022 වසර තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම්

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කිරීම

ආවරණය කර ඇති පැවරුම් කාර්යය

- කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමුකරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳ වරජයට උපදෙස් දීම (1)

- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම (2)

- ජාතික සංවර්ධන අරමුණු තවදුරටත් ඉදිරියට ගෙනයාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණවල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම (3)

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියාකිරීම (7)

- කෘෂිකාර්මික පර්යේෂණ වලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම (11)

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන 25 ක පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම

ප්‍රතිපත්ති සභාවේ වඩාත්ම වැදගත් පැවරුම් කාර්යයක් වන්නේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීමයි. වැවිලි, ආහාර භෝග, ධීවර, පශු සම්පත්, වන විද්‍යා හා මල් වගාව යන අංශ ආවරණය වන පරිදි, අමාත්‍යාංශ පහක් යටතෙහි පවතින, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 25 හි පර්යේෂණ කටයුතු සඳහා රජයේ අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව වෙන් කරනු ලැබේ. එබැවින්, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රමුඛතා අනුව එම අරමුදල් භාවිතයෙහි යෙදවෙන්නේ ද යන්න සොයා බැලීම ඉතා වැදගත් වේ. 2022 වසරෙහි ක්‍රියාකාරී සැලසුම්

විශ්ලේෂණය කරන ලද්දේ එම ක්‍රියාකාරී සැලසුම් ප්‍රතිපත්ති සභාව විසින් ස්ථාපනය කරන ලද පර්යේෂණ ප්‍රමුඛතාවනට අනුකූල වන බව පරීක්ෂා කිරීමට ය. මෙම විශ්ලේෂණය පදනම් කර ගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ තත්ත්ව වාර්තාව වාර්ෂික ව පිළියෙළ කර විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රකාශනයට පත්කරනු ලැබේ.තත්ත්ව වාර්තාව මුද්‍රණය කරනු ලබන්නේ සිව් වාර්ෂික ව ය. පර්යේෂණ ආයතන 24 ක් වෙතින් ක්‍රියාකාරී සැලසුම් ලබා ගන්නා ලදී.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) - 2022 වර්ෂය

ශ්‍රී ලංකාවේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) යනු ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි (NARS) කෘෂිකාර්මික පර්යේෂණ සහ ජාතික විශ්ව විද්‍යාල පද්ධතියෙහි කෘෂිකාර්මික/ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සැපයීමේ වැඩසටහනයි. මෙම ව්‍යාපෘති සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් නිශ්චිත කාල සීමාවක් සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්ට අනුකූලව ය.

මෙම වැඩසටහනෙහි අනු-ක්‍රියාකාරකම් වනුයේ,1. එළඹෙන වර්ෂය සඳහා පර්යේෂණ සංකල්ප පත්‍රිකා කැඳවීම, අගැයීම හා තෝරා ගැනීම 2. තෝරාගන්නා ලද සංකල්ප පත්‍රිකා සම්බන්ධ පර්යේෂණ යෝජනාවලි කැඳවීම 3. පර්යේෂණ යෝජනාවලි ප්‍රදානය කිරීම 4. භාණ්ඩාගාරය වෙතින් අරමුදල් ලබා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම 5. ක්‍රියාකාරී පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම 6. ක්‍රියාකාරී පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය කිරීම7. ව්‍යාපෘතිවල සමාප්ති වාර්තා අගැයීම යි.

වසර 1 සිට 3 දක්වා වන කාල සීමා සඳහා වාර්ෂිකව ව්‍යාපෘති ප්‍රදානය කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්මාන්තය සම්බන්ධ පර්යේෂණ සිදුකරන ජාතික විශ්ව විද්‍යාල සඳහා දැනට අරමුදල් සපයනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම නමැති විශේෂ අයවැය ශීර්ෂයක් වෙත කෙළින් ම අරමුදල් සම්ප්‍රේෂණය කරනු ලැබේ. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතෙහි පවතින, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම - ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය නමැති විශේෂ අයවැය ශීර්ෂයක් මඟින් එම පද්ධතිය තුළ සිදු කෙරෙන පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයුම සිදු වේ.

පළමුවෙන් ම අදාළ සංකල්ප පත්‍රිකා කැඳවීම සිදු කරන ලදී. ඉන් පසු, පර්යේෂණ යෝජනාවලි කැඳවීම සඳහා වඩාත් සුදුසු සංකල්ප පත්‍රිකා තෝරා ගැනීම පිණිස එම පත්‍රිකා තෝරා ගැනීම් නිර්ණායක අනුව අගැයීමට පාත්‍ර කර තෝරා ගැනීම් ලකුණු අනුව ශ්‍රේණිගත කරනු ලැබිණ.තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා හා සම්බන්ධ පර්යේෂණ යෝජනාවලි කැඳවීම සිදු කරන ලදී. මෙයින් අනතුරු ව, අදාළ විෂයයෙහි ප්‍රවීනයන් වන බාහිර සමාලෝචකවරුන් දෙදෙනකු විසින් ප්‍රතිපත්ති සභාව විසින් සකස් කරන ලද අගැයීම් නිර්ණායක අනුව

පර්යේෂණ යෝජනාවලි අගැයීම/ සමාලෝචනය කිරීම සිදු කර අවසන් නිර්දේශ කිරීම සඳහා අදාළ ආංශයික කමිටුව වෙත ද අනුමත කිරීම පිණිස සභා පාලක මණ්ඩලය වෙතද යොමු කරනු ලැබිණ.

සභා පාලක මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමෙන් පසු ව එම පර්යේෂණ යෝජනාවලි සඳහා වන අරමුදල් අවශ්‍යතාව කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදී.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිදු කෙරෙන පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධ ව, අදාළ විශ්ව විද්‍යාලයෙහි උප කුලපති, ප්‍රතිපත්ති සභාව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය එක් ව ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කරනු ලැබේ.

ක්‍රියාකාරි පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය කිරීම, ප්‍රතිපත්ති සභා නිලධරයන් විසින් වර්ෂය මුළුල්ලෙහි ම සිදු කෙරෙයි. ක්‍රියාකාරි පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, ආයතනය තුළ සිදු කෙරෙන විද්‍යුත් ප්‍රදර්ශක ඉදිරිපත් කිරීම් මඟින් ද පර්යේෂණ ස්ථානවල දී සිදු කෙරෙන ස්ථානීය අධීක්ෂණය කිරීම මඟින් ද සිදු වේ.

පර්යේෂණ ව්‍යාපෘති කටයුතු නිම කිරීමෙන් අනතුරු ව, ප්‍රතිපත්ති සභාව විසින් සම්පාදනය කරන ලද උපදේශන මාලාවට අනුකූල ව ව්‍යාපෘතිවල සමාප්ති වාර්තා පිළියෙළ කෙරේ. මෙම වාර්තා, බාහිර සමාලෝචකවරුන් දෙදෙනකු විසින් ප්‍රතිපත්ති සභාව විසින් සකස් කරන ලද අගැයීම් නිර්ණායක අනුව අගැයීමට බඳුන් කර,අවසන් නිර්දේශ කිරීම සඳහා අදාළ ආංශයික කමිටුව වෙත ද අනුමත කිරීම පිණිස සභා පාලක මණ්ඩලය වෙතද යොමු කරනු ලැබේ. ප්‍රධාන ගවේශකවරුන්, සිය ආයතන ව්‍යාප්තිකාරක සේවාවන් හරහා, පර්යේෂණ ප්‍රතිදාන අදාළ භාවිතකරුවන් වෙත සම්ප්‍රේෂණය කරති.

2022 වසරෙහි දී මෙම වැඩසටහන යටතෙහි නව ව්‍යාපෘති ප්‍රදානය කරනු නොලැබිණ. නව ව්‍යාපෘති ආරම්භ නො කිරීමට රජය ගත් තීරණය මෙයට හේතුව විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි 35 ක් සහ ජාතික විශ්ව විද්‍යාලවල 10 ක් ලෙස ක්‍රියාත්මක වූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 45 ක් විය. පළමුවැනි සහ දෙවැනි අර්ධ සඳහා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි සහ විශ්ව විද්‍යාලයන්හි ව්‍යාපෘති වෙතින් ලබා ගන්නා ලදු ව, අර්ධ වාර්ෂික ප්‍රගති අධීක්ෂණය අදාළ කමිටු/ අනුකමිටු විසින් විශාලන තාක්ෂණය ඔස්සේ සිදු කරන ලදී. පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය, ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, රනිල හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ක්ෂෙත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ පේරාදෙනිය විශ්ව විද්‍යාලයය විසින් සිදු කළ පර්යේෂණ ව්‍යාපෘති 31 ක වාර්ෂික ස්ථානීය ප්‍රගති අධීක්ෂණය කිරීම නිම කෙරිණ. මෙයට අමතර ව, සමාප්ති වාර්තා 20 ක් ලබා ගන්නා ලද අතර අගැයීම පිණිස බාහිර සමාලෝචකවරුන් වෙත යවනු ලැබිණ. සමාප්ති වාර්තා 20 ක අගැයීම නිම කරන ලද අතර 8 ක අගැයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

2022 වසරෙහි දී, 2023 වසර සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් සැපයීම පිණිස පර්යේෂණ ව්‍යාපෘති කැඳවීම සිදු කළ ද පර්යේෂණ සංකල්ප පත්‍රිකා නොලද හෙයින්, 2021 වසරෙහි දී ලද පර්යේෂණ සංකල්ප පත්‍රිකා අරමුදල් සැපයීම උදෙසා සලකා බැලීම සිදු කෙරිණ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් මෙම වසරෙහි දී පර්යේෂණ සංකල්ප පත්‍රිකා 20 ක් වෙතින් ව්‍යාපෘති යෝජනාවලි කැඳවන ලදී. බාහිර සමාලෝචකවරුන් විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි පර්යේෂණ ව්‍යාපෘති 12 ක් හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතියෙහි පර්යේෂණ ව්‍යාපෘති 4 ක් අගයන ලදු ව, අදාළ ආංශයික කමිටු වෙතින් නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරු ව සභා පාලක මණ්ඩලයෙහි අනුමැතිය ද අරමුදල් සැපයීම පිණිස ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජාතික ආංශයික කමිටු

සභා පාලක මණ්ඩලය විසින් පිහිටුවන ලද ජාතික ආංශයික කමිටු හයක් වර්තමානයේ දී ක්‍රියාත්මක වෙයි: එනම්,

ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFCS)

වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව(NCPCS)

මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFLS)

වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFS)

ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFARS)

පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව (NCLPS) වේ.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS), ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය (NS) සහ පෞද්ගලික අංශය නියෝජනය කරමින් එහි අදාළ අංශයන්හි ලබා ගන්නා ලද විශේෂඥතාව හා පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් මෙම කමිටු සාමාජිකවරුන් පත් කෙරිණ. ඒ ඒ අංශය නියෝජනය කරන සභා පාලක මණ්ඩල සාමාජිකවරයා අදාළ කමිටුවෙහි සභාපති ලෙස පත් කරන ලදී.

ආහාර භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFCS)

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS), ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය (NS) සහ පෞද්ගලික අංශය නියෝජනය කර සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 16 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ

අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි ආහාර භෝග අංශය නියෝජනය කරන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ නිලධර එල්. ජී. හෙට්ටිආරච්චි මහතා කමිටුවෙහි ලේකම් විය. 2022 වසරෙහි දී එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. ආහාර භෝග අංශයසඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා සාකච්ඡා කරන ලදී. පර්යේෂණ හිඩැස්/ ලුහුඬුතා සහ අවශ්‍යතා හඳුනා ගැනීම ප්‍රධාන කමිටුවට සහය වීම පිණිස, කෘෂිකාර්මික පෛව තාක්ෂණය, ශාක ආරක්ෂණය, ශාක අභිජනනය සශ්‍ය විද්‍යාව හා පශ්චාත් අස්වනු තාක්ෂණය යන විෂයයන් යටතෙහි අනුකමිටු පහක් පත්කරනු ලැබිණ.

ශෂ්‍ය විද්‍යාව පිළිබඳ ජාතික අනු කමිටුව NSCA)

2022 වර්ෂයේදී කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී .මෙම අනුකමිටුව යටතේ පවත්වනු ලබන ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලද අතර 2023දී ප්‍රදානය කිරීම සඳහා නව ව්‍යාපෘති යෝජනාවලි පහක් 5ක් නිර්දේශ කරන ලදී.

ආචාර්ය එම්. ඒ. පී. ඩබ්ලිව්. කේ. මලවිආරච්චි මහතා ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ (FCRDI මෙම අනුකමිටුවේ සභාපතිවරයා වූ අතර එල්. ජී. හෙට්ටිආරච්චි මහතා ප්‍රතිපත්ති සභාව/ (SLCARP කමිටුවේ ලේකම්වරයා විය .මෙම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින් ලෙස මහාචාර්ය එස් . සුබසිංහ රුහුණ විශ්වවිද්‍යාලයය/ (UR සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ DOA නියෝජනය කරමින් ආචාර්ය මනෝජ් කොඩිකාර ,ආචාර්ය එම්.එස්.නිජමුඩීන් සහ උදය රත්නායක මහතා සහභාගී වූහ.

ශාක අභිජනනය පිළිබඳ ජාතික අනු කමිටුව (NSCPB)

කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි .ශාක අභිජනනය පිළිබඳ ජාතික අනු කමිටුව යටතෙහි සිදුකෙරෙමින් පවතින පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම පිණිස කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලද අතර ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ප්‍රදානය සඳහා නව පර්යේෂණ ව්‍යාපෘති යෝජනාවලි හතරක් 4නිර්දේශ කිරීම වෙනුවෙන් එක් කමිටු රැස්වීමක් පැවැත්විණි.

ආචාර්ය එස්.කේ. වාසල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ DOA මෙම අනුකමිටුවේ සභාපති ලෙස කටයුතු කළ අතර එල්. ජී. හෙට්ටිආරච්චි මහතා ප්‍රතිපත්ති සභාව/ (SLCARP මහතා කමිටුවේ ලේකම්වරයා විය .පී. මාලති මහත්මිය, ආචාර්ය ජීවනි දිද්දුගොඩ, ආචාර්ය සුමිත් අබේසිරිවර්ධන, ඩබ්ලිව්. ඩී. ලෙස්ලි මහතා සහ මහාචාර්ය එස්. ඒ. සී. එන්. පෙරේරා කමිටු සාමාජිකයින් ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වූහ.

ශාක ආරක්ෂණය පිළිබඳ ජාතික අනු කමිටුව - NSCPP

කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලද අතර ,එක් රැස්වීමක් ක්‍රියාකාරි පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ද අනෙක් රැස්වීම ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ප්‍රදානය සඳහා නව පර්යේෂණ ව්‍යාපෘති යෝජනාවලි තුනක් නිර්දේශ කිරීම පිණිස ද විය.

මහාචාර්ය දේවිකා කොස්තා පේරාදෙනිය විශ්වවිද්‍යාලයය/ UP මෙම අනුකමිටුවේ සභාපතිනිය වූ අතර එල්.ජී . හෙට්ටිආරච්චි මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව/ (SLCARP කමිටුවේ ලේකම්වරයා විය .ආචාර්ය ඩබ්ලිව්. ඒ. ආර්. ටී. වික්‍රමආරච්චි සහ සුසන්ති චන්ද්‍රසේන මහත්මිය කමිටු සාමාජිකවරු ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වූහ.

ශාක ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික අනු කමිටුව - NSCPBT

මෙම අනු කමිටුවෙහි සාමාජිකවරු වන්නේ සභාපති මහාචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක පේරාදෙනිය විශ්ව විද්‍යාලයය/ ,UP මහාචාර්ය චම්මි අත්තනායක , කැළණිය විශ්ව විද්‍යාලයය/ UK, ආචාර්ය ඩී. බන්දුප්‍රිය කොළඹ විශ්ව විද්‍යාලයය/ ,(UC ආචාර්ය ගාමිණී සමරසිංහ , කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ආචාර්ය ජයන්ත සේනානායක වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය/RRDI යි.

පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ජාතික අනු කමිටුව - NSCPHT

මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය/ USJP මෙම අනු කමිටුවෙහි සභාපතිද මහාචාර්ය ඩී. ඒ. එන්.ධර්මසේන (පේරාදෙනිය විශ්වවිද්‍යාලයය/) ,UP මහාචාර්ය එච්. කේ.සාරානන්ද (වයඹ විශ්ව විද්‍යාලයය/ ,(WUSLමහාචාර්ය ඉල්මි හේවාජුලිගේ , (කාර්මික තාක්ෂණ ආයතනය/ ,(ITIමහාචාර්ය පාලිත වීරක්කොඩි (ජාතික පසු අස්වනු තාක්ෂණ කළමනාකරණ ආයතනය/ (NIPHM සාමාජිකවරු ද වූහ.

වැවිලි භෝග අංශය පිළිබඳ ජාතික කමිටුව (NCPCS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 14 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි බහු වාර්ෂික භෝග අංශය නියෝජනය කරන, තේ පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ, ආචාර්ය සමන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා කමිටුවෙහි ලේකම් විය. 2022 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව

දැනුවත් වනු ලැබිණ. වැවිලිහෝග අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFLS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 09 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි මල් වගා අංශය නියෝජනය කරන, ජාතික විද්‍යා පදනමෙහි සභාපති, මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණි මහත්මිය කමිටුවෙහි ලේකම් වූවා ය. 2022 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. මල් වගා අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම සහ කමිටුව යටතෙහි ක්‍රියාත්මක වූ පර්යේෂණ ව්‍යාපෘති දෙකක සමාලෝචනය පිළිබඳ ව සාකච්ඡා කරන ලදී.

වන වගා අංශය පිළිබඳ ජාතික කමිටුව (NCFS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 08 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි වන වගා අංශය නියෝජනය කරන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක වන සංරක්ෂක, ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා ලේකම් විය. 2022 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. වන වගා අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.

ධීවර හා ජලජ සම්පත් අංශය පිළිබඳ ජාතික කමිටුව(NCFARS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 11 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි ධීවර අංශය නියෝජනය කරන, ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි මැතිතුමා මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි පර්යේෂණ නිලධර එල්. ජී. හෙට්ටිආරච්චි මහතා කමිටුවෙහි ලේකම් විය. 2022 වසරෙහි දී එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. ධීවර හා ජලජ සම්පත් අංශය සඳහා

පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම සහ කමිටුව යටතෙහි ක්‍රියාත්මක වූ පර්යේෂණ ව්‍යාපෘති දෙකක සමාලෝචනය පිළිබඳ ව සාකච්ඡා කරන ලදී.

පශු සම්පත් හා කුකුළු පාලන අංශය පිළිබඳ ජාතික කමිටුව (NCLPS)

සභාපති සහ ලේකම් ඇතුළු ව සාමාජිකවරු 10 දෙනෙක් මෙම කමිටුවට ඇතුළත් වූ අතර එම සියලු දෙන ම පත් කරන ලද්දේ සභා පාලක මණ්ඩලය විසිනි. සභා පාලක මණ්ඩලයෙහි පශු සම්පත් අංශය නියෝජනය කරන, පශු පර්යේෂණ ආයතනයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ,පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන මහත්මිය මෙම කමිටුවෙහි සභාපති වූ අතර ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණි මහත්මිය කමිටුවෙහි ලේකම්වරිය වූවා ය. 2022 වසරෙහි දී අන්තර්ජාලය හරහා එක් කමිටු රැස්වීමක් පැවැත්විණ. රැස්වීමෙහි මූලාරම්භයේ දී ම යොමු කිරීමේ අනුදේශ සාකච්ඡාවට බඳුන් කර එය පිළිබඳ ව දැනුවත් වනු ලැබිණ. පශු සම්පත් හා කුකුළු පාලන වැවිලි භෝග අංශය සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම අරභයා මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී. කමිටුව යටතෙහි ක්‍රියාත්මක වූ පර්යේෂණ ව්‍යාපෘති දෙකක සමාලෝචනය පිළිබඳ ව ද සාකච්ඡා කෙරිණ.

ස්ථානීය ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම

ප්‍රතිපත්ති සභාවේ එක් පැවරුම් කාර්යයක් වන්නේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය පර්යේෂණ විසින් පවත්වනු ලබන පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම යි. ඒ අනුව ,ප්‍රතිපත්ති සභාව විසින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි සිදුකෙරන පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම කලින් කල සිදු කරනු ලැබේ .අදාළ ජාතික කමිටු /අනුකමිටු මගින් ප්‍රධාන ගවේශකවරුන් ගේ විද්‍යුත් දර්ශක ඉදිරිපත් කිරීම් හරහා ව්‍යාපෘතිවල අර්ධ වාර්ෂික ප්‍රගතිය සය මසකට වරක් ඇගයීමට ලක් කෙරේ .මෙයට අමතරව අදාළ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඇගයීම පිණිස, කමිටු සාමාජිකවරු සහ ප්‍රතිපත්ති සභානිලධරයන් ඇතුළු කණ්ඩායමක් වාර්ෂිකව හෝ අවශ්‍ය වූ විට ස්ථානීය ව්‍යාපෘති අධීක්ෂණය සිදු කරති.

වර්ෂය තුළ ,පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යානභෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය, ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, රනිල හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ක්ෂෙත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ පේරාදෙනිය විශ්ව විද්‍යාලයය විසින් සිදු කළ පර්යේෂණ ව්‍යාපෘති 31 ක වාර්ෂික ස්ථානීය ප්‍රගති අධීක්ෂණය හා සමාලෝචනය සිදු කරන ලද අතර එම විස්තර පහත පරිදි වේ.

පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි (FRDI) ස්ථානීය පරීක්ෂාව - හොරණ

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
ඉහළ අස්වනු ලබා දෙන සහ මනා ගුණාත්මය සහිත දෙමුහුන් අන්නාසි ප්‍රභේද සංවර්ධනය	අයි. කළුබෝවිල මහත්මිය	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.





උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි (HORDI) ස්ථානීය පරීක්ෂාව - ගන්නෝරුව

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
ශ්‍රී ලංකාවේ තෝරාගත් එළවළු භෝගවල ප්‍රධාන මූල-ගැට (නෙමටෝඩාවන්) මෙලොයිඩජයින විශේෂ/ (.Meloidogyne spp පාලනය සඳහා ඵලදායී හා කාර්යක්ෂම ප්‍රතිවිරෝධක බැක්ටීරියා වෙන්කිරීම සහ මහා පරිමාණයෙන් වගා කිරීම.	කේ. එම්. ඩී. ඩබ්ලිව්. පී. නිශාන්ත මහතා	අලෙවි කළ හැකි නිෂ්පාදන කිහිපයක් සංවර්ධනය කර ඇති බැවින් ප්‍රගතිය සතුටුදායකය.
මාළු මිරිස් භෝගයෙහි අභ්‍යන්තරික බැක්ටීරියා එකලස් කිරීම් සහ ශාක වර්ධනය සහ ශ්‍රී ලංකාවේ ඇන්ත්‍රැක්නෝස් රෝග පාලනය කෙරෙහි ඒවා සිදු කරන බලපෑම.	එම්.එස්.ඩබ්ලිව්.ප්‍රනාන්දු මහත්මිය	පවතින ප්‍රගතිය යහපත් බැවින් ව්‍යාපෘති කාලය මාස 6කින් දීර්ඝ කිරීමට කමිටුව නිර්දේශ කළහ.
තෙත් සහ වියලි කලාපයේ ස්ථාවර පොස්පරස් බහුල එළවළු වගා කරන පසෙහි භාවිත කිරීම සඳහා විශේෂිත පොස්පරස් ද්‍රාවක ක්ෂුද්‍ර ජීවී (PSM)මූල ගැටිති සංවර්ධනය කිරීම.	කේ. කේ. කේ. නවරත්න මහත්මිය	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කර දෙවන අදියර සඳහා යාමට නිර්දේශ කෙරිණ.
ශ්‍රී ලාංකීය තත්ත්වය යටතේ බතලවල ශාක වර්ධනය ,උකහා ගැනීම සහ අල අස්වැන්න	ඩී .පී .කරුණානන්ද	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
කෙරෙහි ශෂ්‍ය විද්‍යාත්මක හා ශාක ව්‍යුහ විද්‍යාත්මක අංශවල බලපෑම අධ්‍යයනය කිරීම.	මහත්මිය	බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.
ශ්‍රී ලංකාවේ තක්කාලි භෝගයෙහි, බීජ මගින් බෝවන බැක්ටීරියා කුණුවීම් රෝග කළමනාකරණය සඳහා ඒකාබද්ධ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම.	ඩබ්.ඒ.පී.ජී.වීරරත්න මහත්මිය	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.





ශාක ජාන සම්පත් මධ්‍යස්ථානයෙහි (PGRC)ස්ථානීය පරීක්ෂාව - ගන්නෝරුව

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
බෝග වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තෝරාගත් බෝගවල වනගත ප්‍රභේදවල ජාන විවිධත්වය තක්සේරු කිරීම සහ ඇගයීම	ආචාර්ය එස්.කේ.වාසල	ව්‍යාපෘතිවල අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.
බීජ ජාන බැංකුවේ දිගු කාලීන සංරක්ෂණය සඳහා තෝරාගත් බෝග විශේෂවල අධි-වියළි බීජ, වායුරෝධක තත්ත්ව යටතේ ගබඩා කිරීමේ දී හැසිරීම.	ආචාර්ය එස්.කේ.වාසල	ව්‍යාපෘතිවල අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.
තෝරාගත් සාම්ප්‍රදායික වී ප්‍රභේදවල දුඹුරු පැළ කීඩැවා ප්‍රතිරෝධී ප්‍රවේශකයන් තුළ අණුක සහ රූප විද්‍යාත්මක ගතිලක්ෂණ හෙළිකිරීම සහ ජාන හඳුනා ගැනීම (;*නිලපර්වාටා ඉයුජන්ස්* කුලය:ඩෙල්ෆාසිඩේ)	ඩී. එස්. කැකුලන්දර මහත්මිය	ව්‍යාපෘතිවල අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.

ආහාර පර්යේෂණ ඒකකයෙහි (FRU) ස්ථානීය පරීක්ෂාව - ගන්නෝරුව

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
පළතුරු සහ එළවළු යුෂ සැකසීම සඳහා නවෝත්පාදන යෙදවීම :සීනි එකතු නොකළ පලතුරු සහ එළවළු මිශ්‍ර කලිලමය යුෂ නිෂ්පාදන සැකසීම සහ සංරක්ෂණය කිරීම පිළිබඳ විමර්ශනයක්	ආචාර්ය සී.කේ.ඩී. වෙල්ලාල	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.

ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයෙහි (NRMC)ස්ථානීය පරීක්ෂාව - පේරාදෙණිය

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
මිරිස් (*Capsicum annuum*)විවිධ වර්ධන අවධීන්හිදී දක්වන පෝෂක ඉල්ලුම සමඟ විවිධ කාබනික පොහොර වර්ගවල වියෝජනය සහ පෝෂක මුදා හැරීම සමකාලිකරණය කිරීම	ආචාර්ය ඒ.ජී.චන්ද්‍රපාල	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
කාර්යක්ෂම ගුරුත්වාකර්ෂණ නල වාරිමාර්ග පද්ධති හරහා මැද/උඩරට අතරමැදි කලාපයේ ජල හිඟ, බෑවුම් සහිත බිම්වල ඉඩම් හා ජල ඵලදායිතාව වැඩිදියුණු කිරීම	සී.කේ.වික්‍රමතුංග මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.

ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි (GLORDC) ස්ථානීය පරීක්ෂාව - අඟුණුකොළපැලැස්ස





ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
අග්‍රාකෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදයේ අස්වැන්න ,පසු අස්වනු ආයු කාලය සහ ගුණාත්මක භාවය කෙරෙහි අස්වැන්න නෙළීමට පෙර ගිබරෙලින් යෙදීමේ බලපෑම ඇගයීම	අයි. ආර්. ලියනගේ මහත්මිය	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.
ශ්‍රී ලංකාවේ වියළි කලාපය සඳහා සුදුසු තෝර පරිප්පු ප්‍රභේද හඳුන්වා දීම සහ ගොවීන් සඳහා ශෂ්‍ය විද්‍යාත්මක පැකේජයක් සකස් කිරීම.	එස්. යාපා මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
බඩ ඉරිහු වගා කරන ලද රතු දුඹුරු පූර්ණ පෘථිවි පසෙහි භෞතික හා ජල තාප ගුණාංග සහ කාබන් ගතිකය කෙරෙහි සහල් දහයියා සහ ඉරිහු කරල් පෙව-අහුරු තනි යෙදවුමෙහි දිගුකාලීන බලපෑම	එස්.ටී. මුණසිංහ මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
ජම්බෝ රටකජු සඳහා මධ්‍ය කාලීන රටකජු ප්‍රභේද(.*Arachishypogaea L*)සංවර්ධනය කිරීම	වයි. පී. ජේ.අමරසිංහ මහතා	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කෙරිණ.
කොළ සහ කරල් නිෂ්පාදනය සඳහා මුරුංගා *Moringaoleifera*))ප්‍රභේද සංවර්ධනය කිරීම	ඩී. වීරසේකර මහතා	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කර දෙවන අදියර සඳහා යාමට නිර්දේශ කෙරිණ.
සැබෑ බීජ නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයට හොඳින් ගැලපෙන පොකුරු ලූණු රේඛීය කාණ්ඩ සංවර්ධනය	ඊ්. කේ. ඊ්. සී.නයනා මහත්මිය	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
ශ්‍රී ලාංකීය තත්ත්වයන් සඳහා සුදුසු, ඉහළ අස්වැන්නක් ලබා දෙන කළු ඇට තල රේඛීය කාණ්ඩයක්/ රේඛීය කාණ්ඩ සංවර්ධනය කිරීම	ආචාර්ය යූ. අයි. පී. පෙරේරා	දැනට පවතින ප්‍රගතිය යහපත් බැවින් ව්‍යාපෘති කාලය මාසයකින් දීර්ඝ කිරීමට කමිටුව නිර්දේශ කළහ.
ආනයනික නාරං වර්ග ප්‍රතිස්ථාපනය කිරීම පිණිස ශ්‍රී ලංකීය නාරං වර්ග)හීන්නාරන් (ඇගයීම සහ නිර්දේශ කිරීම	ඩබ්ලිව්.ඒ.විජිතවර්ණ මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
ශ්‍රී ලංකාව තුළ සියඹලා සහ පැණිරස සියඹලා ප්‍රභේද ඒකරාශි කිරීම ,සංරක්ෂණය කිරීම ,ඇගයීම ,නිර්දේශ කිරීම සහ වාණිජකරණය	ඩබ්ලිව්.ඒ.විජිතවර්ණ මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයයෙහි (UP) ස්ථානීය පරීක්ෂාව -

ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තෝරාගත් භෝග ක්ෂේත්‍රවල පාංශු ජල විද්‍යාත්මක හා තාප ගතිකය කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම් හඳුනා ගැනීම.	ආචාර්ය ඩී. එන්. විදාන ගමගේ	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
අනුරාධපුර දිස්ත්‍රික්කයේ මතුපිට පස්වල විෂ විය හැකි අංශු මූලද්‍රව්‍යවල තත්ත්වය :වී සඳහා මූලික සාන්ද්‍රණ , අවකාශීය ව්‍යාප්තිය සහ වී ශාකය විසින් උරා ගැනීම පිණිස පැවතීම	ආචාර්ය ඒ. එම්. සී. පී. කේ. අත්තනායක	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කර දෙවන අදියර සඳහා යාමට නිර්දේශ කෙරිණ.

ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි (FCRDI) ස්ථානීය පරීක්ෂාව - මහ ඉලුප්පල්ලම

ව්‍යාපෘතිමාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ, වියළි කාලවලදී, පහත් බිම් කුඹුරු යටතෙහි සත්ත්ව ආහාර පිණිස ඉදල් ඉරිහු වගා කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක කළමනාකරණ පැකේජයක් සංවර්ධනය කිරීම	ආචාර්ය ඒ. පී. ඩබ්ලිව්. කේ.මලවිආරච්චි	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
කෙටි කාලීන මුංඇට භෝගයේ කහ විචිත්‍ර වෛරසය සහ උඳු (*Vignamungo* L) භෝගයේ පිටි පුස් ප්‍රතිරෝධී මාපිය රේඛීය කාණ්ඩ සහ ඒවායෙහි රෝග ප්‍රතිරෝධී උරුමතා ආකාර හඳුනාගැනීම	එම්.ජේ.එම්.පී. කුමාරරත්න මහත්මිය	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.





වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි (RRDI) ස්ථානීය පරීක්ෂාව - බතලේගොඩ

ව්‍යාපෘතිමාතෘකාව	ප්‍රධාන ගවේශක	නිර්දේශය
ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වල්පැළ මර්ධන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සෘජු බීජ වැපුරුම් වී භෝගයෙහි ඒකාබද්ධ වල්පැළ කළමනාකරණය සඳහා ප්‍රවේශ	ආචාර්ය එච්.එම්.එස් . හේරත්	ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවසන් කර දෙවන අදියර සඳහා යාමට නිර්දේශ කෙරිණ.
ශ්‍රී ලංකාවේ සෘජු බීජ වැපුරුම් වී භෝගයෙහි ධාන්‍ය බිහිවීම් අවධියේදී පොටෑසියම් සහ ජල පරිහරණ කාර්යක්ෂමතාව උපරිම කිරීම හරහා සහල් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම	ආචාර්ය අයි. ඩබ්ලිව්. එම්.අයි. ඉලංගකෝන්	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
වී භෝගයෙහි අස්වනු විභවය වැඩිදියුණු කිරීම සඳහා නව රූපීය-ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම	එල්.සී.සිල්වා මහතා	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
වී භෝගයෙහි ගඩු මැසි ප්‍රතිරෝධය වර්ධනය කිරීම සඳහා නව්‍ය අභිජනන මෙවලම් යෙදීම	ඩබ්ලිව්. ඒ. ආර්.ධම්මිකා මහත්මිය	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.
වියළි සෘජු බීජ වැපිරීම සහ නියඟයට ඔරොත්තු දීම සඳහා වී ප්‍රවේණි වර්ග සංකල්පගත කිරීම සහ ඉලක්කගත ජාන ප්‍රකාශන පිළිබඳ අධ්‍යයනය	ආචාර්ය ඩී.එම්.ජේ.බී.සේනානායක	ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායකයි.





2022 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු සහ සම්මේලන

ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහි ප්‍රතිපත්ති සම්පාදකවරුන් සහ භාණ්ඩාගාරය සමඟ පැවැත්වුණු වාර්ෂික සංවාදය



ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහි ප්‍රතිපත්ති සම්පාදකවරුන් සහ භාණ්ඩාගාරය සමඟ පැවැත්වුණු වාර්ෂික සංවාදය, 2022 නොවැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේදී පැවැත්විණි .ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි හා අදාළ අමාත්‍යාංශවල නිලධරයන්ගෙන් සහ සභා පාලක මණ්ඩල සාමාජිකවරුන් ගෙන් සැදුණු 49 දෙනෙක් මෙම සංවාදයට සහභාගී වූහ .**කෘෂිකාර්මික අංශය හරහා රටෙහි ආර්ථිකය දියුණු කිරීම පිණිස** කෘෂිකාර්මික **පර්යේෂණවල වැදගත්කම සහ කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ දැවෙන ප්‍රශ්න සාකච්ඡා කිරීම උදෙසා ජාතික** කෘෂිකාර්මික **පර්යේෂණ පද්ධතියේ විද්‍යාඥවරුන් සහ අදාළ අමාත්‍යාංශවල** නිලධරයන් **වෙනුවෙන් වේදිකාවක් සකස් කිරීම මෙම සංවාදයේ අරමුණ විය** .සංවාදය ආරම්භ කිරීමට පෙර ,ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි අනාගත දිශානතිය ,වත්මන් තත්ත්වය තුළ කෘෂිකාර්මික පර්යේෂණවල වැදගත්කම ,කෘෂිකාර්මික පර්යේෂණ පිළිබඳ වත්මන් රජයේ ප්‍රතිපත්තිය සහ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තියේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම් හතරක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පාලක මණ්ඩලයේ සභාපති, මහාචාර්ය ගාමිණී සේනානායක මැතිතුමා සහභාගී වූවන් පිළිගෙන සංවාදයේ අරමුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ,‘‘ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ අනාගත දිශානතිය’’ යන මැයෙන් සිය ඉදිරිපත් කිරීම සිදු කළේය . කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ආචාර්ය ඩබ්ලිව්. එල්. ගාමිණී සමරසිංහ මහතා ආහාර අනාරක්ෂිත භාවය මහහරවා ගැනීම පිණිස කෘෂිකාර්මික පර්යේෂණ සොයාගැනීම් වල වැදගත්කම

අවධාරණය කරමින්, විදේශ විනිමය උපයා ගැනීම උදෙසා අපනයන වෙළෙඳපොළක් සංවර්ධනය කිරීමෙහි අවශ්‍යතාව පැහැදිළි කළේය .මුදල් ,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා රට තුළ අරමුදල් බෙදාහැරීමේ වත්මන් තත්ත්වය පැහැදිලි කළේය .කෘෂිකාර්මික පර්යේෂණවල වැදගත්කම මහා භාණ්ඩාගාරය විසින් හඳුනාගෙන ඇති බවත් ,එම පර්යේෂණ වැඩසටහන් සඳහා අරමුදල් සැපයීමේ යාන්ත්‍රණයක් සකස් කළ යුතු බවත් ඔහු විසින් මතු කර දැක්විණ. දායක ආයතන සමඟ සාකච්ඡා කර එම ආයතන වෙත ඉදිරිපත් කරනු වස්, කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවලින් දායක අරමුදල් ව්‍යාපෘති යෝජනාවලි ඉදිරිපත් කරන ලෙස ද කුමාරසිරි මහතා ඉල්ලා සිටියේය .ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. චන්ද්‍රා පද්මිණී මහත්මිය විසින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ අදාළ පර්යේෂණ සොයාගැනීම් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම ඉදිරිපත් කරනු ලැබිණ .මෙම ඉදිරිපත් කිරීම්වලින් අනතුරුව පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවක් ආරම්භ කරන ලද අතර , ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහි නිලධරයන් පෙන්වා දුන්නේ මිනිස් බල හා විද්‍යාත්මක උපකරණ හිඟය සහ අරමුදල් සැපයුම් ප්‍රමාණවත් නොවීම, තම ආයතනවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට ඇති බරපතළ ගැටළු බවයි .ප්‍රතිපත්ති සභාවෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා පස්වරු 1.45ට ස්තුති කථාව පැවැත්වීමෙන් පසු ව රැස්වීම අවසන් කෙරිණ.

මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2022





ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින්, මෙම ක්ෂේත්‍රයේ මෑත කාලීන පර්යේෂණ සොයාගැනීම් මතු කර දැක්වීම සහ ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා, 2022 දෙසැම්බර් මස 22 වන දින, දෙමුහුම් සම්මේලනයක් (අන්තර්ජාලය ඔස්සේ සහ භෞතික

වශයෙන්) ලෙස මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මේලනය (NASFLOR-2022) සංවිධානය කරන ලදී. පර්යේෂකවරු, වගාකරුවෝ, අපනයනකරුවෝ සහ ප්‍රතිපත්ති සම්පාදකවරු සම්මේලනයට සහභාගී වූ අතර මෙම අංශය සංවර්ධනය කිරීම අරභයා ඔවුන් ගේ අත්දැකීම් හුවමාරු කර ගත්හ. මල් වගා අංශයට අදාළ පර්යේෂණ පත්‍රිකා 14 ක් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද අතර එම පත්‍රිකා ප්‍රචාරණය සහ වගා කිරීම, නව්‍යතා හා ප්‍රවණතා **සහ** ආලෝකය ,සෙවණ හා ප්‍රභාසංස්ලේෂණය ලෙස කාණ්ඩ තුනකට වර්ග කරනු ලැබිණ.පාර්ශවකරුවෝ 150දෙනෙක් පමණ සම්මන්ත්‍රණයට සහභාගී වූහ .පේරාදෙණිය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ෂෙලෝමි ක්‍රිෂ්ණරාජා මහත්මිය විසින් රැස්ව සිටි පිරිස පිළිගන්නා ලදී .ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි මල් වගා අංශය පිළිබඳ ජාතික කමිටුවේ සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා සම්මන්ත්‍රණයේ අරමුණ ඉස්මතු කළේය .සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයා වූයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ, කෘෂිකර්ම පීඨයේ මහාචාර්ය චාලින්ද බෙනරගමය .එතුමා මෙම අංශයේ අවස්ථා සහ ප්‍රවණතා පැහැදිලි කළේය.

ධාරිතාබල ගොඩනැංවීමේ වැඩසටහන




ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් 2018 වසරෙහි දී, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහි නිලධරයන් වෙනුවෙන් ධාරිතා බල වර්ධන වැඩසටහනක් ආරම්භ කර ඇත. පද්ධතියෙහි බොහෝ විද්‍යාඥවරුන් හට පශ්චාත් උපාධි සුදුසුකම් නොතිබූ නිසාත් මෙම තත්ත්වය නිසි පර්යේෂණ වැඩසටහන් සිදුකිරීමට බාධාවක් වූ නිසාත් එම විද්‍යාඥවරුන් හට පශ්චාත් උපාධි පුහුණුව ලබාදීම පිණිස එම වැඩසටහනෙහි අරමුණ විය.මෙම වැඩසටහනෙහි කාලසීමාව 2018 සිට 2022 දක්වා වන වසර පහක් වේ. ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබන මෙම වැඩසටහනට හැම වසරක් සඳහා ම මිලියන 300.00ක් වෙන් කරනුලැබිණ.

මෙම වැඩසටහන යටතෙහි ,ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහි නිලධරයන්හට ශිෂ්‍යත්ව 79ක්

ලබා දී ඇති අතර ඔව්හු ඉන්දියාව ,පිලිපීනය ,මැලේසියාව සහ තායිලන්තය වැනි ආසියානු රටවල්හි විවිධ විශ්ව විද්‍යාලවල විද්‍යාපති උපාධි හෝ ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වී සිටිති .**ප්‍රතිපත්ති සභාව** අනුග්‍රාහක ආයතනය ලෙස ශිෂ්‍යත්වලාභීන් හට පහසුකම් සලසා දුනි.

මෙම වැඩසටහන යටතේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (NARA), පාරිසරික අධ්‍යයන අංශයේ, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ නදීෂා ඩිලානි හෙට්ටිගේ මහත්මිය සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කර 2022සැප්තැම්බර් මස 06 වන දින **ප්‍රතිපත්ති සභාවෙහි** සභාපතිවරයා සහ ලේකම් / අධ්‍යක්ෂ වෙත සිය උපාධි නිබන්ධනය ඉදිරිපත් කළා ය .ඇයගේ පර්යේෂණ මාතෘකාව වූයේ ‘‘ජීව විද්‍යාත්මක දර්ශක ලෙස,ජලජ අපෘෂ්ඨවංශීන් භාවිත කරමින් කාබනික අපවිත්‍රතා තක්සේරු කිරීම් සඳහා නව ආදර්ශකයක්’’ යි .ශ්‍රී ලංකාව වැනි රටක ජල මූලාශ්‍රවල ජීව විද්‍යාත්මක කාරකයක් යොදා ගනිමින් ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමට හැකි වන මෙම සොයා ගැනීම ඉතා වැදගත් වේ.

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය

ආවරණය කර ඇති පැවරුම් කාර්යභාරය

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවලට අවශ්‍ය වන මූල්‍ය, මිනිස්බල හා භෞතික සම්පත් පිළිබඳ ව සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම (4)

- ආයතනයික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ එම ආයතනවල ප්‍රමුඛතා හා අරමුදල් සැපයීම සම්බන්ධයෙන් සහ මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම (5)

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන, අංශ, සහ ව්‍යාපෘතිවල කාර්ය සාධනය වරින් වර සමාලෝචනය කිරීම (13)

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු (INFORM)

own perspective, plans, and programs for the future in keeping with the aspirations and goals of the Ministry of Agriculture Development and Agrarian Services to meet the future challenges in enhancing domestic food production and exports focused on poverty reduction.

f) **Our Vision** - A vibrant and sustainable agricultural research, development, and innovation system assuring the socio-economic development of Sri Lanka.

g) **Our Mission** - To ensure agricultural research, development, and innovations are directed towards national development goals through policy formulation, facilitation, coordination, monitoring and evaluation, and impact assessment.

h) **Our Mandated Functions - SLCARP**

(1) To advise the Government on all matters regarding the organization, coordination, planning, and execution of agricultural research and such other related matters as may be referred to it by the Minister.

(2) To formulate national agricultural research policy and priorities.

(3) To define the overall aims and scope of agricultural research with a view to furthering national development objectives.

(4) To make recommendations to the appropriate authorities on the financial, manpower, and physical resources required by agricultural research institutions and establishments and on the terms and conditions of service of the staff of such institutions and establishments.

(5) To review Institutional and departmental agricultural research programs and make recommendations with regard to their priorities and funding to the Ministry of the Minister in charge of the subject of Finance and Planning.

(6) To promote and facilitate excellence in agricultural research.

(7) To act as a channel of communication between agricultural research institutions and the Government.

(8) To arrange for and fund inter-institutional agricultural research projects.

(9) To arrange for and fund special scientific services for the entire agricultural research sector.

(10) To promote linkage between agricultural research institutions at national and international levels.

(11) Organize conferences and seminars on international, national, and inter-Institutional issues relating to agricultural research.

(12) To arrange for the post-graduate training of agricultural research staff and for the interchange of scientists with recognized research institutions abroad.

(13) To review the performance of agricultural research projects, institutions, and divisions from time to time.

16.1.2. National Agricultural Research Plan (NARP-NUS)

The Sri Lanka Council for Agricultural Research Policy (SLCARP), is the Apex Body of the National Agricultural Research System and is charged with the major responsibility of an advisory role along with aiding, promoting, coordinating, and monitoring research, related to agriculture and allied areas in the country.

The National Agricultural Research Plan (NARP) is one of the main mandatory functions, of the Sri Lanka Council for Agricultural Research Policy with the objective of facilitating Agricultural research. The NARP projects are designed in accordance with the national research priority areas identified by Sri Lanka Council for Agricultural Research Policy. Currently, funds are provided mainly to the Department of Agriculture, and National Universities where agriculture-related research projects are carried out.

16.1.2.1 NARP-NUS (118-02-03-026-2507) - 2022	Rs.
Budget Allocation	20,000,000.00
Received funds from the Ministry of Agriculture	9,324,000.00
Expense during the year	(9,287,983.00)
Balance Transferred to the Ministry of Agriculture 31.12.2022	**36,017.00**

16.1.3. Capacity Building Programme

SLCARP identified the importance of the Human Resources Development of National Agriculture Research System (NARS) researchers. Thus, SLCARP submitted a proposal to the Ministry of Agriculture for Capacity Building of the Researchers of the NARS for which a Cabinet Memorandum was issued on 21 September 2017 under the heading of Directing of Researchers of the NARS for Foreign postgraduate degree training.

Under this program, NARS researchers have obtained opportunities to register Universities in India, Thailand Malaysia, and the Philippines. The number of Candidates who have received admission under the Capacity Building long-term training Programme of SLCARP during 2018 – 2022 is listed below.

Ongoing scholars of the Capacity Development Programme.

	No of Scholars
University Putra Malaysia - Malaysia	34
University of Philippines Los Banos – Philippines	17
University of the Philippines Diliman – Philippines	01
Total	**52**

Completed scholars of the Capacity Development Programme.

	No of Scholars
University Putra Malaysia - Malaysia	06
University of Philippines Los Banos – Philippines	09
Kasetsart University – Thailand	03
Asian Institute of Technology (AIT) – Thailand	03
Chaudhary Charan Singh Haryana Agricultural University – India	01
Kerala Agricultural University– India	01
C S K Himachal Pradesh KrishiVishvavidyalaya – India	01
Prof. Jayasankar Telangana State Agricultural University– India	01
Acharya N.G Ranga Agricultural University – India	01
Total	**26**

Discontinued Scholar of the Capacity Development Programme.

	No of Scholars
University of Philippines Los Banos – Philippines	01
Total	**01**

16.2.1 Accounting Policies and Concepts;

Accounting policies consist of principles, bases, conventions, rules and procedures, and also Accounting concepts are ideas and assumptions which are fundamental to accounting practices. Therefore some of our accounting concepts are as follows.

16.2.2 Basis of measurement

The financial statements have been prepared on a historical cash basis. No adjustment has been made for inflationary factors in the financial statement.

16.3 Functional and presentation of currency

The financial statement for the year end 2022 was presented in Sri Lankan rupees (LKRs.) and nearest cents.

However, we have decided to present our Financial Statement in LKRs. And round to the nearest rupee which is effective from the financial year January 01st 2011 and ahead. The year 2022 was presented in LKRs. and rounded to the nearest rupee.

The stipend and Expense fees relating to the Capacity Building program are paid in USD ($) where that Expense is converted to LKR at the spot rate of the transaction date and prepaid the stipend and University fees are taken into financial statements at the rate of Balance sheet rate. The difference arising due to changes in the Exchange rate has been taken into financial statements as exchange gain or Loss.

16.4 Accounting for Govt. Grants disclose of Govt. Assistance

(a) Accounting for Government Grants & Disclosure of Government Assistance is adopted.

(b) We further say, that accounting policy had been adopted with regard to the government grants was the method of capital approach but that government grant was related to the fixed assets it had been taken to the accounts under the method of the income approach.

(c) A Deferred Income Fund has been identified only in respect of the assets purchased since 2018.

16.4.1 Capital Grants (Treasury Grants Research)

According to the Sri Lanka Council for Agricultural Research Policy Act No.14 of 1987, all the Grants received need to be credited to CARP Fund and all the expenses need to be done out of that. In that Sense Capital Grants (Treasury Grants Research) need to be considered as a supplementary Note to the CARP Fund and the remaining balance need to be reflected in the CARP Fund each Year. Then only Carp Fund will be remaining as an Equity Fund in the Statement of Financial Position.

16.4.2 Research Management Activities

Generally, the Capital Fund is utilized to Research Management Activities where the requirements of LKAS 38 for Intangible assets are not complied with. Hence the Research management activities are in a nature where that could not be capitalized. Due to that reason both the expense and amount of Funds are shown in the Comprehensive Income Statement in order to reflect the effect.

17. 1. VALUATION OF ASSETS

1.1 Property Plant & Equipment

Property plant & equipment are on the balance sheet at cost less accumulated depreciation and is provided on the straight-line method at the following rates per annum.

a)	Building	05%
b)	Computer & printers	30%
c)	Computer Software	30%
d)	Office Equipment	15%
e)	Office Furniture	15%
f)	Vehicles	25%
g)	Road	05%
h)	Library Book	05%
j)	Electronic Data	30%

1.2 Trade & Other Receivables

Trade & Other Receivables incurred Staff Debtors, Unsettled Research Imprest, Deposits, Prepayment, Income receivable & Project receivables.

1.3 Composition of EPF & ETF rates;

	Employer	Employee	Total
EPF	15%	10%	25%
ETF	03%	-	03%

1.4 Unsettled Research Imprest

The research imprest has been given to various research Institutes/ Universities in Sri Lanka. However, some of the research institutes/ Universities do not settle this research imprest at the year-end such an amount is stated as an unsettled research imprest and the council noted advised to take the necessary step to settle this unsettled amount.

1.5 Stocks

Stocks are shown in the financial statement at lower market value or purchase price. The stock is valued using the FIFO method. The Non Consumables are classified as stock items based on the nature of that category which was previously presented in the Property plant and equipment. The Depreciation provided so far is reversed back to Prior Year Adjustments.

1.6 Gratuities

A provision has been made according to regulations 5 of the Gratuity Act. No.12 of 1983 in respect of employees eligible under the Act.

1.7 Receivable Deposits

Values of refundable and receivable deposits are named as follows;

A. W. Ranasinghe (Filling Station - Kollupitiya)
Postgraduate Institute of Management - Library
Sri Lanka Telecom – IDD

1.8 Other Disclosures.

1.8.1 Pending TT amount of University Putra Malaysia.

The amount of 10,294.24 USD has been transferred to the beneficiary University Putra Malaysia as the University fee of scholars and it was transferred on 27.12.2022. the bank paid twice due to bank error and transferred the aforesaid amount again to the beneficiary University Putra Malaysia on 30.12.2022. The bank is functioning to recover from the concerned institution.

2.0 Ownership of the Building SLCARP

The request has been made to the Secretary Ministry of Agriculture to clear the ownership of the land and building which is used by the SLCARP.

2.1 Pending Litigation and investigation of the SLCARP

2.1.1 Pending Litigation of Mr. W.M.D. B. Abyerathne.

The Council noted the present status after the disciplinary inquiry - Mr. W.M.D. B. Abyerathne, Former Accountant, SLCARP. In addition, the council approval was also granted to hand over the case against Mr. W.M.D. B. Abyerathne to Attorney General to cover Rs. 587, 418 the amount which is to be recovered from him.

2.1.2 CARP ICRAF Tree Domestications Project.

In 2015, after coming to know about the current account number 232246 maintained at the Bank of Ceylon Torrington branch under the name CARP ICRAF Tree Domestications Project under the Sri Lanka Agricultural Research Policy Council, the SLCARP informed the bank and it was suspended on 21.08.2015. SLCARP has the account, which has been handed over to the Criminal Investigation Department of Sri Lanka for further investigation of this current account. The report of the investigation has not been received, and there is a Rs. 1,232,754.67 balance in the account as of 31.12.2022.

Our Corporate Information

As at 31st of December 2022

Name of the State Owned Enterprise

Sri Lanka Council for Agricultural Research Policy

Ministry

Ministry of Agriculture

Secretary to the Ministry

Mr. Gunadasa Samarasinghe

Classification of General Treasury (PED /COP/POLI/Circular-17.06.2015)

Budgetary Funded – Research and Development Agencies/ Entities established under an Act. of Parliament to perform research and development activities for the benefit of the National Economy or in the wider interest of the public are deemed as Research and Development Agencies.

Supervision and Monitoring Role Managed by

Department of Public Enterprises (PED)

Carder Supervision & Corporate Plan Managed by

National Salaries and Carder Commission / Department of Management Services (MSD)

and

Department of Public Enterprises (PED)

Annual Budget and Action Plan Managed by

Department of National Budget

Governed by

The Council of Sri Lanka Council for Agricultural Research Policy

Head of the Council

Secretary / Director

Legal Form

Incorporated Under the Parliament Act.

Sri Lanka Council for Agricultural Research Policy Act, No. 47 of 1987

Registered Office

No.114/ 09, Vidya Mawath , Colombo -07

Sri Lanka

Telephone Numbers

+94-11-2697103, 2697648, 2698001, 2685688, 2665076, 2665077, 665517

Fax Number

0094 – 11 – 2982951

E-mail - slcarp.agri@gmail.com

Our Website - www.slcarp.lk

Auditors to the SL CARP

Auditor General

Secretary to the Council / Head of the Department

Secretary / Director

Bankers

Bank of Ceylon –Supper Grade Branch, Independence Square, Colombom07, Sri Lanka.

- **Current A/C No. 2323310**
- **Swift Code BCEYLKLX, Bank Code 7010, Branch Code 453**
- **Telephone Number 0094 - 11-2692506**

Lawyers to the SL CARP

Attorney General, AG's Department, Colombo 01, Sri Lanka.

Auditor's Comment

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

2018 සිට 2022 වර්ෂය දක්වා අයවැය තොරතුරු

වර්ෂය	2018		2019		2020	
විස්තරය	පුනරාවර්ථන	ප්‍රග්ධන	පුනරාවර්ථන	ප්‍රග්ධන	පුනරාවර්ථන	ප්‍රග්ධන
මුළු අයවැය ඇස්තමේන්තුව	353,761,221.28	189,500,000.00	287,550,000.00	40,000,000.00	366,000,000.00	23,000,000.00
අනුමත අයවැය	350,000,000.00	35,000,000.00	200,000,000.00	30,000,000.00	204,500,000.00	1,000,000.00
මුදල් ලැබීම්	112,584,500.00	14,350,000.00	168,350,300.00	15,000,000.00	164,482,000.00	1,000,000.00
මුළු වියදම්	84,153,907.00	14,945,548.00	173,238,521.45	16,192,602.90	154,417,863.85	999,087.00

වර්ෂය	2021		2022	
විස්තරය	පුනරාවර්ථන	ප්‍රග්ධන	පුනරාවර්ථන	ප්‍රග්ධන
මුළු අයවැය ඇස්තමේන්තුව	214,395,700.00	75,644,000.00	209,575,000.00	82,545,000.00
අනුමත අයවැය	200,000,000.00	40,000,000.00	200,000,000.00	20,000,000.00
මුදල් ලැබීම්	111,487,100.00	13,480,000.00	130,510,000.00	8,100,000.00
මුළු වියදම්	111,143,791.00	13,235,506.40	118,241,333.00	4,975,381.00

පිළියල කලේ

පරීක්ෂා කලේ

Summary of the Recommendations

Made at the Audit and Management Committee Meetings conducted in year 2023

Composition of the Audit & Management Committee in year 2022.

Audit & Management Committee:

1. Ms. B.A.N Harshani Perera – Chairman of the Committee, / Deputy Director, Department of National Planning - Ministry of National Policies and Economics Affairs. (65th & 66th Meetings)

2. Dr. S.H.S Ajantha De Silva – Member, AMC /Director General, Department of Agriculture (65th meeting)

3. Dr. H.M.P Kithsiri – Member, AMC / Director General, National Aquatic Resources Research and Development Agency (65th meeting)

4. Dr. W. L. G. Samarasinghe, – Member, AMC / Additional Secretary (Agric. Tech), Ministry of Agriculture (66th meeting)

5. Mr. Chithral Jayawarna, – Member , AMC / Chief Manager, Sri Lanka Port Authority (66th meeting)

By Invitation:

1. Ms. W.S Bopegamage - Audit Superintendent / Agriculture Insurance Board
2. Mr. E.W.G.K Priyadarshana - Chief Internal Auditor / Ministry of Agriculture

On Call:

1. Dr. P.H.P.C Girihagama - Deputy Director (Research Management), SLCARP
2. Mrs. R.Y.M.P Ranathunga - Assistant Director (Administration), SLCARP

Numbers of Meetings Convened with Duties:

65th Audit & Management Committee Meeting - 20th September 2022

66th Audit & Management Committee Meeting – 30th December 2022

All recommendation of the Audit & Management Committee Meetings held have been submitted to the council for SLCARP.

Recommendations made at the Audit & Management Committee Meetings:

Papers submitted at the 65th AMC Meeting	Submission Requirements		Action By
	Information	Recommendation	
Confirmation of Minutes of the 64th AMC Meeting	Submitted for Information	-	Secretary
The Financial Progress month of January to August 2022	Submitted for Information	-	Secretary
කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කල කළමනාකරණ විගණන වාර්තා	-	Submitted for Recommendation	Secretary
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා වූ විගණකාධිපති විගණන වාර්තාව.	-	Submitted for Recommendation	Secretary
General Audit Quarries and Answers	Submitted for Information	-	Secretary
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විස්තරාත්මක විගණකාධිපති විගණන වාර්තාව	-	Submitted for Recommendation	Secretary
රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2015 රජයට අයත් සමාගම් ව්‍යවස්ථාපිත මණ්ඩල හා වාණිජ සංස්ථා වල නිලධරයන් හට ප්‍රවාහන හා ඉන්ධන දීමනාව යටතේ ගෙවූ මුදල් නැවත අයකර ගැනීම	-	Submitted for Recommendation	Secretary
Revised Recurrent Budget - First and Second Quarter 2022	-	Submitted for Recommendation	Secretary
Write-off Receivable Balance Continuing in the Financial Statement.	-	Submitted for Recommendation	Secretary
Payable Balance Continuing in the Financial Statement.	-	Submitted for Recommendation	Secretary
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් ක්‍රියාත්මක කළ ගිවිසුම් ගත පර්යේෂණ සදහා (Contract Research) ලබා දුන් අත්තිකාරම් මුදලින් තව දුරටත් නොපියවූ 422,662.47 ක ශේෂය සම්බන්ධව.	-	Submitted for Recommendation	Secretary
Estimate SLCARP Budget Forecasting - 2023	-	Submitted for Recommendation	Secretary
වසා දමන ලද ලංකා බැංකු කොල්ලුපිටිය ශාඛාවේ ගිණුම් අංක 1632497 දරන (Project Management Unit) ගිණුමේ පවතින රු. 98,234.70 ශේෂය සම්බන්ධවයි.	-	Submitted for Recommendation	Secretary

Papers submitted at the 66th AMC Meeting	Submission Requirements		Action By
	Information	Recommendation	
Confirmation of Minutes of the 65th AMC Meeting	Submitted for Information	-	Secretary
Matters Rising from the Minutes	Submitted for Information	-	Secretary
The Financial Progress	Submitted for Information	-	Secretary
කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කල කළමනාකරණ විගණන වාර්තා	-	Submitted for Recommendation	Secretary
Delegation of Financial Authority Limits - 2023.	-	Submitted for Recommendation	Secretary
Revised Recurrent Budget – 4th Quarter 2022	-	Submitted for Recommendation	Secretary
Revised Capital Budget - 2023	-	Submitted for Recommendation	Secretary

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ARI/C/SLCARP/1/22//10/FA

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 29 දින

සභාපති

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- (1) ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

(2) ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. ARI/C/SLCARP/1/22//10/FA | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2023 මැයි 29 දින

සභාපති

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ, සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වත්කම් පන්ති 5 ක පිරිවැය රු.28,766,620 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව එම ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂි වන වගාව පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර ඇතිකරගෙන තිබුණු පර්යේෂණ හා විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාව සඳහාවන "කෘෂි වන වගාව" පිළිබඳ අවබෝධතා ගිවිසුම අනුව ආරම්භකළ CARP-ICRAF Tree Domestication නැමති ව්‍යාපෘතියට ලබාගත් අංක JW-3904 දරන මොටර් රථය එම ව්‍යාපෘතිය නමින් ලියාපදිංචි කර ඇතත් අදාළ ව්‍යාපෘතිය නිම වීමෙන් පසු, ප්‍රතිපත්ති සභාවට පවරා නොගෙන එවකට සම්බන්ධීකරණ විද්‍යාඥ ලෙස කටයුතු කරන ලද වර්තමානයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු විසින් පුද්ගලික පරිහරණයට යොදාගෙන තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පශ්චාත් උපාධි සඳහා විදේශගත වූ ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් 25 දෙනෙකු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපත්ති සභාවට නොදන්වා මෙරටට පැමිණ සිටිය මුත් එම කාලසීමාව සඳහා ගෙවා තිබුණු රු.10,049,580 ක යැපුම් දීමනාව ආපසු අයකරගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පවතින ගොඩනැගිල්ලට කොටසක් එකතු කරගැනීම සඳහා එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව රු.12,945,000 කට ඇස්තමේන්තු කර රු.12,300,000 කට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පිරිනමා තිබුණි. ඔවුන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2020 අප්‍රේල් 30 දින මුත් වැඩ අවසන් කර නොතිබුණු අතර 2022 ඔක්තෝබර් 10 දින වන විට සහතික කළ වැඩවල වටිනාකම රු.5,516,590 ක් වුවත් ඔවුන් වෙත රු.12,217,303 ක මුදලක් ගෙවා තිබුණු හෙයින් සහතික නොකළ වැඩ සඳහා රු.6,700,713 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) කෘෂි වන වගාව පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර ඇතිකරගෙන තිබුණු පර්යේෂණ හා විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාව සඳහා වන අවබෝධතා ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලද "කෘෂි වන වගාව" පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා කෙන්යා පර්යේෂණ මධ්‍යස්ථානයකින් ලද මූල්‍යාධාරවලින් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අංක 2323246 දරන ව්‍යාපෘති බැංකු ගිණුමෙහි පැවති රු.1,232,755 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා, පර්යේෂණ ආයතන 3 කට හා විශ්වවිද්‍යාල 3 කට ලබාදුන් මුදල්වලින්, ඉතිරිව ඇති රු.459,131 ක් මෙතෙක් සභාව වෙත ගෙන්වා නොගෙන 2006 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි.

(උ) ප්‍රතිපත්ති සභාවේ හිටපු සභාපතිවරයාගේ ධූර කාලය 2018 නොවැම්බර් 07 දින අවසන් වී ඇතත් 2018 නොවැම්බර් 07 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා මාස දෙකකට ආසන්න කාලය සඳහා රු.197,600 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇතත් එම මුදල මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

1.3 ප්‍රතිපත්ති සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ප්‍රතිපත්ති සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ප්‍රතිපත්ති සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ප්‍රතිපත්ති සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ප්‍රතිපත්ති සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ප්‍රතිපත්ති සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, 1.2 ඡේදය දැක්වෙන තොරතුරු හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ප්‍රතිපත්ති සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.(අ), (ඇ), (ඊ) සහ (උ) ඡේද වල දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක්නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රතිපත්ති සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ප්‍රතිපත්ති සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රතිපත්ති සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූළ නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ප්‍රතිපත්ති සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	**නිරීක්ෂණ**
1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතෙහි 10 (උආ) උප වගන්තිය ප්‍රකාරව අන්තර් ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම හා මුදල් සැපයීම සභාවේ කර්තව්‍යයක් වේ.	පසුගිය වර්ෂයේදී ව්‍යාපෘති 4 ක් ආරම්භ කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී නව ව්‍යාපෘති හඳුනාගෙන හෝ ඒ සඳහා මුදල් සපයා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රතිපත්ති සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2017 ඔක්තෝබර් 04 දිනැති අංක අමප/17/1992/728/34 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මැලේසියාව, තායිලන්තය හා පිලිපීනය වැනි රටවල් වලදී වසරකට 30 දෙනා බැගින් වසර 5 ක් තුළ පර්යේෂකයින් 150 ක් දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා යොමු කළ යුතු අතර ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතුය. සමාලෝචිත වර්ෂය වන විට එම තීරණයට වසර 5 ක් ගතවී තිබුණද, කොවිඩ් වසංගත තත්ත්වය සහ මූල්‍ය දුෂ්කරතා නිසා ඒ සඳහා යොමුකළ පර්යේෂකයින් සංඛ්‍යාව 79 දෙනෙකු පමණක් වූ අතර එම පර්යේෂකයින් අතරින්ද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කළ යුතු යැයි හඳුනාගෙන ඇති කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් පර්යේෂණ මාතෘකාව තෝරාගෙන තිබෙනුයේ නිලධාරීන් 8 දෙනෙකු පමණක් බව නිරීක්ෂණය විය.

(ආ) කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන "ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම" (NARP) නම් වූ කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පවතින ව්‍යාපෘතිය සිදු කරනු ලබන පර්යේෂණවල අවසන් වාර්තා සභාව විසින් සමාලෝචනය කළ යුතු වුවත් 2015 සිට 2020 දක්වා කාලයට අදාළව නිම කිරීමට නියමිතව පැවති පර්යේෂණ 4 ක අවසන් වාර්තා කාලීනව ලබා ගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාලෝචනය කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපත්ති සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි.

(ඇ) බංග්ලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව, මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සභාව සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර 2011 හා 2016 වර්ෂවලදී ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උපදේශකයින් හා විද්‍යාඥයින් හුවමාරු කිරීම යටතේ කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමුකිරීමට 2019, 2020 සහ 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම්හි දක්වා තිබුණද අදාළ රාජ්‍යයන් වෙතින් ප්‍රතිචාර නොලැබීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එවැනි පුහුණුවීම් අවස්ථා සඳහා නිලධාරීන් යොමුකර නොතිබුණි.

(ඉ) කෘෂිකාර්මික අතථ්‍ය පුස්තකාල (Virtual Library) පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා පසුගිය වර්ෂයේදී සැලසුම් කර තිබුණද භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම නිසා විගණිත දින වන විටත් එම පද්ධතිය ස්ථාපනය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් පසුගිය වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර තිබුණු ජාතික සම්මාන උළෙල (SLCARP National Awards) සඳහා අයදුම්පත් කැඳවා, ඇගයීම් කමිටු පත්කර, ඇගයීම් කටයුතු අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම සම්මාන උළෙල පවත්වා නොතිබුණි.

බඩලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1.2 <u>තත්ත්වාගුණනය කළ මතය සඳහා පදනම</u>

(අ) එකඟ වේ.

පිරිවැය රු.28,766,620 ක් වන ස්ථාවර වත්කම් රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින අතර ඉදිරි ගිණුම් වර්ෂය තුළදී අදාළ වත්කම් තුළ ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ කෘෂි වන වගා පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යාන්තර මධ්‍යස්ථානය (ICRAP) අතර ආරම්භ කළ CARP –ICRAP Tree Domestication සඳහා JW 3904 දරණ කැබ් රථයක් එම ව්‍යාපෘතිය නමින් ලියාපදිංචි වී ඇති බවට තොරතුරු සභාවේ නොතිබූ අතර රජයේ විගණන අංශය විසින් පෙන්වා දී ඇති පරිදි මෙම වාහනයේ තහවුරු කර ගැනීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇත (ඇමුණුම 01). ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(ඇ) විදේශීය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් කිහිප දෙනෙකු විදේශීය පශ්චාත් උපාධි අධ්‍යන කාල සීමාව තුල සභාව වෙත දැනුම් දීමකින් තොරව ශ්‍රී ලංකාවට පැමිණීම නිසා ඔවුන්ගෙන් අය කර ගත යුතුව තිබූ මුදලින් 2023/04/28 වන දිනට අය කර ගත යුතුව පවතින ශේෂය රු 9,144,370.00 කි.

ශිෂ්‍යයින් වෙතින් මෙම මුදල අය කර ගැනීම සඳහා ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. තව ද, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ඊට අනුයුක්ත ආයතනයන්හි ශිෂ්‍යයන් කිහිප දෙනෙකු වෙතින් මෙම මුදල් වාරික වශයෙන් අය කර සභාව වෙත යොමු කරනු ලබයි.

(ඈ) මෙම ගොඩනැගිලි කොටස ඉදි කිරීම සඳහා 2019.09.03 වන දින මාස 06 ක කාල පරිච්ඡේදයක් සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ගතව ඇත.

ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඉදි කර ගෙන ගිය නමුත්, 2020 වසර සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන මෙම කටයුත්ත සඳහා වෙන් නොවීම හේතුවෙන් ඉදිකිරීම් සිදු කර තිබුණද අප ආයතනය ට ගිවිසුම් ප්‍රකාරව ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට තිබූ මුදල් ගෙවීමට නොහැකි වීය. අවස්ථා කිහිපයකදීම මුදල් ඉල්ලුම් කරමින් ලිපි යොමු කළ ද ගෙවීමට නොහැකි පසු බිමක ඉදිකිරීම් කටයුතු ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව නවතන ලදි.

ඒ අනුව ගිවිසුම ප්‍රකාරව ඉතිරි මුදල් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කර අතර, ඉදිකිරීම් සඳහා 2021 වසරේ සහ 2022 වසරේ වෙන් කරන ලද මුදලින් මෙම ගිවිසුම ප්‍රකාරව ගොඩනැඟිලි ඉදි කිරීම් කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ගෙන යාම සඳහා අදාළ මුදල් ගෙවන ලදි. ඒ අනුව 2023.05.02 දින වන විට රු.10,012,225.90 ක ඉදි කිරීම් සිදු කර ඇති බව වාර්තා කර ඇත (ඇමුණුම 02).

තව ද, නුදුරේදීම ගිවිසුම් ගත මුදලට අදාළ ඉදිකිරීම් අවසන් කරන බව ද, දන්වා ඇත.

(ඉ) සභාවේ ලේකම්/අධ්‍යක්ෂක විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ කළමනාකරු වෙත දැනුම් දි 2015.01.15 දින මෙම ගිණුම අත්හිටුවා ඇති අතර එම 2323246 ගිණුම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතර මෙම රු.1,232,755 ක ශේෂය සම්බන්ධව අවසන් නිගමනය ලැබෙන තෙක් මෙම ශේෂය ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව වෙත පවරාගෙන භාණ්ඩාගාරය වෙත මෙතෙක් ප්‍රේෂණය කර නොමැති අතර 2022 මූල්‍ය ප්‍රකාශන වල මේ පිළිබඳව හෙලිදරව් කර ඇත.

(ඊ) කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ ආයතන හා විශ්ව විද්‍යාල වලට ලබාදුන් මුදල් වලින් අප ආයතනය වෙත අයවිය යුතු මුදල රු. 659,131ක් වේ. මේ පිලිබඳව පවතින ලිපිලේඛන පරීක්ෂාවේදී රුහුණු විශ්ව විද්‍යාලය වෙත ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් රු.200,00ක බිල්පත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව යොමුකරන ලද අතර ඒඅනුව අයවිය යුතු මුදල රු. 459,131ක් දක්වා අඩු වී ඇත. එසේම අනිකුත් ආයතන වෙතින් අයවිය යුතු මුදල සඳහන් කර ලිපි කිහිප වතාවක් යොමු කර ඇති අතර පිලිතුරු නොලැබීම හේතුවෙන් සිහිකැඳවීම් ලිපිද මේ සම්බන්දව අදාළ ආයතන වෙත යොමු කර ඇත.

(උ) මෙම දීමනා අය කර ගැනීම සම්බන්ධයෙන් වන සභා මණ්ඩල තීරණය විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇත (ඇමුණුම 03)

2. <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2.2.3 පසුගිය වර්ෂයේදී ව්‍යාපෘති 4 ක් ආරම්භ කර තිබුණු නමුත් 2022 වර්ෂයේදී නව ව්‍යාපෘති නොලැබුණු අතර, පැරණි ව්‍යාපෘති 4 සඳහා මුදල් සපයන ලදී.

2.3 <u>වෙනත් කරුණු</u>

(අ) 2017 වසරේ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මැලේසියාව, තායිලන්තය, පිලිපීනය, වැනි රටවල දී වසරකට 30 දෙනා බැගින් වසර 05 ක් තුල පර්යේෂකයින් 150 ක් පුහුණු කළ යුතුව තිබුණ ද කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මේ සඳහා යොමු කරවීමට හැකි වූයේ පර්යේෂකයන් 79

දෙනෙක් වූ අතර එම පර්යේෂකයන් ගේ පර්යේෂණ මාතෘකා ඔවුන්ගේ ආයතනය වලට අත්‍යාවශ්‍යව තිබූ ක්ෂේත්‍රයන් අනුව තෝරා ගන්නා ලදි.

(ආ) කෘෂිකාර්මික පර්යේණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (NARP) ව්‍යාපෘතියේ 2015 සිට 2020 දක්වා කාලයට අදාලව අවසන් පර්යේෂණ වාර්තා 04 ක් තවදුරටත් පර්යේෂකයින් විසින් ලබා දී නොමැති අතර මේ පිළිබඳව සිහි කැඳවීම් සිදු කර ඇත.

(ඇ) කාබනික කෘෂිකර්මාන්තය සඳහා කමිටුවක් පිහිටුවා ඇති අතර 2019 වසරේ මේ පිළිබඳව වැඩමුළු 02 ක් පවත්වා ඇත. තව ද 2020 වසරේ සිට NARP සඳහා ව්‍යාපෘති කැඳවීමේ දී කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ යෝජනා වලට ප්‍රමුඛතාවය දීමට කටයුතු සිදු කර ඇත. එමඟින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ පර්යේෂකවරුන්ගේ උනන්දුව ඇති කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඈ) බංගලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව, මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සභාව සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර 2011 හා 2016 වර්ෂවල දී ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම් අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උපදේශකයින් හා විද්‍යාඥයින් හුවමාරු කිරීම යටතේ කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමු කිරීමට 2019,2020 සහ 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් හි දක්වා තිබුණ ද අදාළ රාජ්‍යයන් වෙතින් ප්‍රතිචාර නොලැබීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවනේ එවැනි පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීමට නොහැකි විය.

(ඉ) Agri-net ස්ථාපනය සඳහා වැඩමුළුවක් පැවැත්වීමට අරමුණු කර තිබුණ ද කොවිඩ් වසංගත කාලය තුළ තිබුණු අවභිරතා සහ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය.

(ඊ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මඟින් 2021 වසරේ දී පැවැත්වීමට සැලසුම් කර තිබූ ජාතික සම්මාන උළෙල (SLCARP National Awards) සඳහා අයදුම්පත් කැඳවා ඇගයීම් කටයුතු අවසන් කර තිබුණ ද මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන අරමුදල් ලබා ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම උළෙල පැවැත්වීමට 2022 වසරේ දී නොහැකි විය.

ප්‍රභාත් විමල් කුමාර
ලේකම් / අධ්‍යක්ෂ

වාර්ෂික වාර්තාව 2022

සාරාංශ වාර්තාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

ආයතනයෙහි කාර්යසාධනය

- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජාතික විශ්ව විද්‍යාල සමඟපර්යේෂණව්‍යාපෘති 45 ක සම්බන්ධීකරණය සිදු කළේ ය. මෙයට අමතර ව, අන්තර්-ආයතනයික සහ බහු-විෂයාත්මකපර්යේෂණ ප්‍රදාන යෝජනාක්‍රමයයටතෙහිපර්යේෂණව්‍යාපෘති 5 ක් සඳහා අරමුදල් සපයනු ලැබිණ. මෙම ව්‍යාපෘති වෙතින් ප්‍රගති වාර්තා **ලබා**ගන්නා ලදු ව, එමවාර්තාඅගැයීමඅදාළ කමිටු/ අනුකමිටු මඟින් සිදුකෙරිණ. වාර්ෂික ස්ථානීය ප්‍රගති අධීක්ෂණය ද සිදු කරන ලදී.

- ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහිප්‍රතිපත්ති සම්පාදකවරුන් සහ භාණ්ඩාගාරය සමඟ පැවැත්වුණු වාර්ෂික සංවාදය, 2022 නොවැම්බර් මස 29 වැනි දිනශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේදී පැවැත්විණි. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි පර්යේෂණආයතන ප්‍රධානීහු,අදාළ අමාත්‍යාංශවල නිලධරයෝ සහ සභා පාලක මණ්ඩල සාමාජිකවරු මෙම සංවාදයට සහභාගී වූහ.රටෙහි කෘෂිකාර්මික පර්යේෂණ හා සම්බන්ධ දැවෙන ප්‍රශ්න පිළිබඳ ව සාකච්ඡා කරනු ලැබිණ. ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියෙහිනිලධරයන්අවධාරණය කළේ, මිනිස් බල හාවිද්‍යාත්මක උපකරණ හිඟය සහ අරමුදල් සැපයුම් ප්‍රමාණවත් නොවීම, තම ආයතනවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට ඇති බරපතළ ගැටළු බවයි.

- ප්‍රතිපත්ති සභාවෙහිධාරිතාබල ගොඩනැංවීමේ වැඩසටහන යටතේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ නිලධරයන්හට ශිෂ්‍යත්ව 79ක් ලබා දී ඇති අතර ඔවුහුඉන්දියාව, පිලිපීනය, මැලේසියාව සහ තායිලන්තයවැනි ආසියානු රටවල්වල විවිධ විශ්ව විද්‍යාලවල ආචාර්ය උපාධි හෝ විද්‍යාපති උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී සිටිති.ප්‍රතිපත්ති සභාවදායක ආයතනය ලෙස පද්ධතියෙහි නිලධරයන්හට අරමුදල් ඇතුළු අවශ්‍ය ආධාර ලබා දී තිබේ.ශිෂ්‍යත්වලාභීන්ගෙන් 26 දෙනෙක් සිය පශ්චාත් උපාධි කටයුතු සාර්ථකව අවසන් කළහ. 52 දෙනෙක් සිය අධ්‍යයන කටයුතු කරමින් සිටිති.

විගණන විමසුම්වල සහ විගණන වාර්තාවල සඳහන් වුණු උණතා නිවැරදි කිරීම උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ග

- ගෙවන ලද මුදල්නැවත අයකර ගැනීම හා සම්බන්ධ නිලධරයන් යළි මෙරටට පැමිණ සිටින හෙයින්, එම මුදල් ඔවුන් ගෙන් අයකර ගැනීමේ පලදායී ක්‍රමවේදයක් ප්‍රතිපත්ති සභාව විසින් අනුගමනය කර තිබේ.
- කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම සිදු කෙරෙන ජාතික කෘෂිකාර්මික පර්යේෂණසැලසුම යටතෙහි සම්පූර්ණ කරන ලද පර්යේෂණවල සමාප්ති වාර්තා ලබා ගැනීමට ද එම වාර්තාසමාලෝචනය කිරීමට ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

- වැවිලි, වැවිලි නොවන, පශු සම්පත් සහ ධීවර යන අංශ තුන වෙතින් ජාතික සම්මාන ප්‍රදාන සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සමාලෝචනය කරනු ලැබිණ. විශිෂ්ඨ පර්යේෂණ 14 ක් තෝරා ගන්නා ලදී.

ක්‍රියාත්මකකිරීමට යෝජිත මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම් වස් රජයෙහි පොදු ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුගමනය කරන ලෙස සමස්ත කාර්ය මණ්ඩලයට නියෝග කර තිබේ.